සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
**Ministry of Women, Child Affairs and Social Empowerment**

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/01/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / Your No: ...........
දිනය / திகதி / Date: 2023.03.27

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල/ බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,
සමෘද්ධි බැංකු/ බැංකු සමිති කළමනාකරුවන්

**සිංහල/ හින්දු අළුත් අවුරුද්දට සමගාමීව, අළුත් අවුරුදු උත්සව පැවැත්වීම සහ ගණුදෙනු චාරිත්‍රය අළලා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනක් පැවැත්වීම - 2023**

ශ්‍රී ලංකාවේ සංස්කෘතික මහා කළා මංගල්‍යය වන සිංහල/ හින්දු අළුත් අවුරුදු උත්සවයට සමගාමීව, සමෘද්ධි බැංකු/ බැංකු සමිති මඟින් සලසන ක්ෂුද්‍ර මූල්‍ය සේවා මෙන්ම සමාජ කටයුතු පිළිබඳ අඩු ආදායම් ලාභීන් ඇතුළු සමස්ත ජනතාව වෙත පණිවිඩයක් රැගෙන යාම මෙන්ම සමෘද්ධි බැංකුවට ඉතුරුම් තැන්පතු රැස් කර ගැනිමේ අරමුණින්, විවිධ වැඩසටහන් රැසක් පහත දිනයන්වල පැවැත්විමට සැලසුම් කර ඇති බව දන්වමි.

| වැඩසටහන | පවත්වන දිනය |
|---|---|
| සමෘද්ධි බැංකු ගණුදෙනු චාරිත්‍රය | 2023.04.17 දින |
| ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන | 2023.04.17 – 2023.05.01 දක්වා |
| සිංහල/ හින්දු අළුත් අවුරුදු උත්සවය | 2023.04.22 දින |

ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ, රු. 500 ඉක්මවූ මුදලක් ඉතුරු කරන ගිණුම් හිමියන්ට තිළිණයක් සුපුරුදු පරිදි ලබා දිමට අපේක්ෂා කරන අතර, අළුත් අවුරුදු උත්සවය සඳහා අවශ්‍ය කරන අරමුදල් සඳහා අනුමත මුදලක් වැය කිරීමට අනුමැතිය ලබා දීමටද අපේක්ෂා කරමි.

ඔබ සමෘද්ධි බැංකුව මඟින් ඉහත වැඩසටහන ක්‍රියාත්මක කිරිමට සූදානම් විය යුතු අතර, ඒ සඳහා බැංකු පාලක මණ්ඩල සහ ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලය දැනුවත් කර, සාකච්ඡා කර සුදුසු වැඩසටහන් සකස් කර ගත යුතුය.
මේ වැඩසටහන් වෙනුවෙන්, සමෘද්ධි ප්‍රජාමූල බැංකු සහ බැංකු සමිති කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඉන් අනතුරුව, අවශ්‍ය සවිස්තරාත්මක උපදෙස් හා මඟපෙන්වීම් ඉදිරියේදි සිදු කරන බවත් තවදුරටත් දන්වමි.

එස්.ඒ.එස්. වික්‍රමසිංහ
අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) වැ.ආ.
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

**පිටපත් :-.**
1. දිස්ත්‍රික් ලේකම්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ස.හා අ.ක.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
4. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
5. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
6. සහකාර අධ්‍යක්ෂ, ප්‍රජාමූල සංවිධාන අංශය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
7. සභාපති, සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහා සංගමය - අ.ක.ස.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |